ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ප්‍රකාශනයකි

# තේ තතු

ISSN 1391 - 6785 වෙළුම 9 කාණ්ඩය 1 2012 ජුනි

## තේ වගා නොකරන ප්‍රදේශයක තේ පාරිභෝගිකයන්ගේ හැසිරීම් රටාව පිළිබඳ අධ්‍යනයක්...

ශ්‍රී ලංකාව හොඳ තත්ත්වයෙන් සහ ගුණාත්මයෙන් යුතු තේ නිෂ්පාදනය කරන රටක් ලෙස ඈත අතීතයේ සිට ප්‍රසිද්ධියට පත්ව ඇත. එහෙත් ලංකාවේ තේ වගා නොකරන බොහෝ ප්‍රදේශ වල ජනතාවට හොඳ තත්ත්වයේ තේ වර්ගයක් පානය කිරීමට නොලැබෙන බවට මතයක් පලවී ඇත. මෙවැනි ප්‍රදේශවල වෙසෙන ජනතාව තේ පානය කරන අන්දම, ඔවුන් පරිභෝජනය කරන තේ වල ස්වරූපය, ඒවා සම්බන්ධව ඔවුන්ගේ තෘප්තිමත්භාවය, ඔවුන්ගේ සමාජ ආර්ථික වටා පිටාව ඒ කෙරෙහි ඇති කරන බලපෑම යනාදී කරුණු අධ්‍යයනය කිරීමේ අරමුණ ඇතිව 2011 වර්ෂයේදී අම්පාර දිස්ත්‍රික්කය පදනම් කර ගනිමින් සමීක්ෂණයක් සිදු කරන ලදි.

ඒ සඳහා අම්පාර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය ප්‍රදේශයක් වන වලගම්පුර, අර්ධ නාගරික ප්‍රදේශයක් වන මහඔය හා නාගරික ප්‍රදේශයක් වන අම්පාර නගරයේ ජීවත්වන විවිධ අධ්‍යාපනික මට්ටම් හා විවිධ වෘත්තීන් වල නියුතු පුද්ගලයන්ගෙන් ඔවුන් තේ පානයට දක්වන රුචිකත්වය හා තේ මිලදී ගන්නා ස්ථාන හා එම තේ වර්ග ගැන අදහස් විමසීමක් සිදු කරන ලදි.

මෙම සමීක්ෂණයෙන් හෙළිවූ පරිදි අම්පාර දිස්ත්‍රික්කයේ ඉහත සඳහන් ප්‍රදේශවල ජනතාව වැඩිපුරම පානය කරනු ලබන අමතර පානය ලෙස තේ දැක්විය හැකිය.

විවිධ වෘත්තීන්වල නියුතු පුද්ගලයන් තේ පානයට දක්වන රුචිකත්වය එකිනෙකට වෙනස් බවත් ඔවුන් දිනකට තේ පානය කරනු ලබන වාර ගණන සහ තේ කෝප්ප ප්‍රමාණයද එකිනෙකට වෙනස් බවත් හෙළිවිය. සෙසු වෘත්තීන්වල නියැලෙන්නන්ට සාපේක්ෂව ගොවීන් වැඩි වාර ගණනක් (වැඩි තේ කෝප්ප ප්‍රමාණයක්) පානයට පුරුදු වී ඇති බවත් අනාවරණය විය. (ගොවීන් දිනකට තේ කෝප්ප 5 හෝ වැඩියෙන් භාවිතාකරන අවස්ථාගනන 70%, chi-square = 4.9, α=0.03) මෙයට හේතුවක් ලෙස දැක්විය හැක්කේ ආර්ථික හා වෙනත් හේතූන් මත ඔවුන්ගේ එක් ආහාර වේලක් තේ වලින් ආදේශනය කරගැනීමට නැඹුරුවී තිබීම වියහැක.

ජනතාව ජීවත්වන ප්‍රදේශය අනුව පරිභෝජනය කරනු ලබන තේ පිළිබඳව ඔවුන් තුළ ඇති තෘප්තිමත්භාවය එකිනෙකට වෙනස් වූ අතර නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශවල ජනතාවට වඩා ග්‍රාමීය ජනතාව ඔවුන් පානය කරන තේ පිළිබඳව වැඩි තෘප්තිමත් භාවයකට පත්වන බව අනාවරණය විය.( ග්‍රාමීය ප්‍රදේශවල තෘප්තිමත්භාවය 73%, chi-square = 11.36, α=0.02)

ජනතාව විවිධ වර්ගයේ තේ පරිභෝජනය කරනු ලබන අතර මෙම ප්‍රදේශයේ ජනතාව ඇසුරුම්ගත තේ සහ සිල්ලර තේ කොළ වැඩිපුරම පරිභෝජනය කරති. මෙහිදී ඔවුන් මිලදී ගන්නා තේ වර්ගය සහ ඒවා පානය කිරීමෙන් ලැබෙන තෘප්තිමත්භාවය අතර පැහැදිලි සම්බන්ධතාවයක් අනාවරණය නොවිණි.

මෙම ප්‍රදේශ වල ජනතාවගේ අධ්‍යාපන මට්ටම් සහ ඔවුන් මිලදී ගන්නා තේ වර්ගය හෝ තේ පානයෙන් ලැබෙන තෘප්තිමත්භාවය අතරද පැහැදිලි සම්බන්ධතාවයක් නොදක්නා ලදි.

ජනතාව කරනු ලබන වෘත්තීය සහ තේ මිලදී ගන්නා ස්ථාන අතර යම් සම්බන්ධතාවයක් පැවැති අතර ගොවීන් වැඩිපුරම තේ මිලදී ගන්නේ සාමාන්‍ය වෙළඳ සැල් වලින් වන අතර සෙසු වෘත්තිකයන් සුපිරි වෙළඳසැල් වලට යොමුවීමේ නැඹුරුතාවයක් පෙන්වයි.

ජනතාවගේ ආදායම් මට්ටම් සහ පරිභෝජනය කරනු ලබන තේ වර්ගය අතර විශේෂිත සම්බන්ධතාවයක් නොමැති අතර ආදායම් මට්ටම් අනුව තේ පානයෙන් ලබන තෘප්තිමත්භාවයෙහිද වෙනසක් නොපෙනිණ.

මෙම ප්‍රදේශයේ ඇසුරුම්ගත තේ පරිභෝජනය කරන ජනතාව එක්තරා විශේෂිත වෙළඳ නාමයකට වැඩිපුරම කැමැත්තක් දැක්වූ අතර ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ එම තේ වර්ගය පිළිබඳ ආකර්ශනීය ප්‍රචාරණය සහ ඇසුරුමේ ඇති ආකර්ශණීයභාවයයි.

මෙම සමීක්ෂණයෙන් පාරිභෝගිකයන්ගේ හැසිරීම් රටාවන් පිළිබඳව යම් යම් කරුණු හෙළිවේ. නිශ්පාදකයන්හට මෙන්ම අලෙවිකරුවන්හටද පාරිභෝගිකයන්ගේ හැසිරීම් රටාවන් පිළිබඳව අධ්‍යයනය කිරීම වැදගත් වේ.

**මහේෂිකා දිල්රුක්ෂි, ජානක මහින්දපාල**